# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/12 — 2012 සැප්තැම්බර් මස 24 වැනි සඳුදා - 2012.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

2010 සැප්තැම්බර් මස 03 දින 1670 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් සභාවේ 1993 අංක 03, 1995 අංක 07 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත 1992 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලබන විධිවිධාන, රීති, නියෝග නියමයන් සහ නියම කිරීම් අනුව සංශෝධනය කරන ලද මගී ප්‍රවාහන සේවා නියෝග වල 04 වන උපලේඛනයේ අංක 01, 06 හා අංක 15 ගාස්තු පමණක් පහත සඳහන් පරිදි නැවත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | මගී සේවා අවසර පත්‍රය සඳහා එක් බස්රථයකට | රු. 5,000.00 |
| 02. | මාසික සේවා ගාස්තුව එක් බස්රථයක් සඳහා (සාමාන්‍ය) | රු. 1,000.00 |
| 03. | මාසික සේවා ගාස්තුව එක් බස්රථයක් (සුඛෝපභෝගී) | රු. 1,000.00 |

මෙම සංශෝධනය 2012.10.01 දින සිට බලපැවැත්විය යුතු ය.

එච්.එම්.උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම්
සහ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 433/1

---

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1993 අංක 03, 1995 අංක 07 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත 1992 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලබන නියෝග,

1992 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 06 වැනි වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත පැවරී ඇති බලතල සහ කර්තව්‍ය යටතේ එම අධිකාරිය මගින් සකස් කරන ලද නියෝග පහත පරිදි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්.එම්.උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම්
සහ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

නියෝග

බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ධාවනය සඳහා නිකුත් කර ඇති මාර්ග බලපත්‍ර වල අයිතිය පැවරීමේ දී දැනට අයකරනු ලබන රු. 60,000.00 ක මුදල 2012.10.01 දින සිට රු. 100,000.00 ක් දක්වා වැඩි කරනු ලැබේ.

10 - 433/2

1A - PG 001392 — 435 (2012/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.